
# අපි ලක් වැසියෝ

- ## ශ්‍රී ලංකාවේ ජාතික කොඩිය



- 1972 මැයි 22 සිට මෙම කොඩිය ශ්‍රී ලංකාවේ ජාතික කොඩිය ලෙස භාවිතයට ගත්තේ ය.
- ශ්‍රී ලංකාවේ අනන්‍යතාවය ලොවට පෙන්වන ප්‍රධාන සංකේතය ජාතික කොඩිය යි.
- ශ්‍රී ලංකාවේ ජාතික කොඩිය සිංහ කොඩිය නමින් ද හඳුන්වයි.
- ජාතික කොඩියේ දිග, පළල මෙන් දෙගුණයකි.
- ජාතියේ හා මාතෘ භූමියේ ඓතිහාසික පසුබිම, පෞඩත්වය, සෛවරීභාවය හා ස්වාධීනත්වය ද ශ්‍රී ලාංකීය ජනතාවගේ එක්සත්භාවය හා සමානාත්මතාව ජාතික කොඩියෙන් පෙන්නුම් කරයි.
- ජාතික කොඩියේ වර්ණ 04 කි.
    1. කහ
    2. රතු
    3. තැඹිලි
    4. කොළ

## ජාතික කොඩියේ ඇති විවිධ සංකේත හා ඒවායේ අදහස

1. රතු පැහැති පසුබිම - ජාතික අභිමානය
2. කහ පැහැති සිංහ රූපය - සිංහල ජාතිය නියෝජනය කිරීම
3. තැඹිලි පාට හා කොළ පාට තීරු - දමිළ , මුස්ලිම් ඇතුළු අනෙකුත් ජාතීන් නියෝජනය කිරීම.
4. මුළු කොඩිය ම වට කර යෙදූ කහ පාට තීරුව - කොඩියේ නිමාව මෙන් ම ජාතීන් අතර එකමුතු බව
5. කොඩිය ඇතුළත ඇති බෝ කොළ සතර - මෙත්තා , කරුණා , මුත්තා , උපේක්ඛා යන සතර බ්‍රහ්ම විහරණ සංකේතවත් වේ.

## ජාතික කොඩිය ඔසවන අවස්ථා

1. නිදහස් උත්සවය සමරණ අවස්ථාවේ දී
2. විදේශී හා දේශීය රාජ්‍ය නායකයින් පිළිගන්නා අවස්ථාවේ දී
3. පාසල් උදය රැස්වීමේ දී
4. වෙනත් විශේෂ උත්සවවල දී

## ජාතික කොඩිය අඩකුඹු කිරීම





1. රාජ්‍ය නායකයන් මිය ගිය විට
2. ජාතික ශෝක දිනයක දී


- ශ්‍රී ලංකාවේ ජාතික ගීය



ශ්‍රී ලංකා ජාතික ගීය
ශ්‍රී ලංකා මාතා...... අප ශ්‍රී.......... ලංකා
නමෝ නමෝ නමෝ නමෝ මාතා......
සුන්දර සිරි බරිනි
සුරැඳි අති සෝබමාන ලංකා..........
ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි
ජය භූමිය රම්‍යා
අප හට සැප සිරි සෙත සදනා.......
ජීවනයේ මාතා..........
පිලිගනු මැන අප භක්ති පූජා
නමෝ නමෝ මාතා ..........
අප ශ්‍රී...............ලංකා
නමෝ නමෝ නමෝ නමෝ මාතා.......
ඔබවේ අප විද්‍යා ............ඔබවේ අප සත්‍යා....
ඔබවේ අප ශක්ති............අප හද තුල භක්ති....
ඔබ අප ආලෝකේ............අපගේ අනුප්‍රාණේ
ඔබ අප ජීවනවේ............අප මුක්තිය ඔබවේ
නව ජීවන දෙමිනේ
නිතින අප පුබුදු කරන් මාතා..........
ඥාන්‍ය වීර්ය වඩවමින රැගෙන යනු
මැන ජය භූමි කරා.....
එක මවකගේ දරු කැල බැවිනා....
යමු යමු වී නොපමා............
ප්‍රේම වඩා සැම භේද දුරැද දා.....
නමෝ නමෝ මාතා......අප ශ්‍රී............ ලංකා
නමෝ නමෝ නමෝ නමෝ මාතා......
අප ශ්‍රී.... ලංකා..... නමෝ නමෝ නමෝ නමෝ නමෝ මාතා

- වර්ෂ 1940 දී **ආනන්ද සමරකෝන්** මහතා විසින් රචිත මෙම ගීය 1951 නොවැම්බර් මස 22 දින සිට ශ්‍රී ලංකාවේ ජාතික ගීය ලෙස නම් කරනු ලැබීය.
- ජාතික කොඩිය එසවීමෙන් පසු ජාතික ගීය ගායනා කරනු ලබයි.

## රාජ්‍ය ලාංඡනය




<u>**රාජ්‍ය ලාංඡනය මගින් පිළිබිඹු වන සමස්ත අදහස**</u>

“ ස්වයංපෝෂිත රටක ඉරහඳ පවතින තෙක් ධර්මය ආරක්ෂා කරමින් මුළු මහත් ජනතාව වැජඹේවා. ”

## රාජ්‍ය ලාංඡනයේ ඇති විවිධ සංකේත මඟින් කියවෙන අදහස වෙන වෙනම

1. පුන්කලස - සෞභාග්‍ය හා පරිපූර්ණ බව
2. වී කරල් - ස්වයංපෝෂිත බව හා සශ්‍රීකත්වය
3. කඩුවක් අතින් ගත් පලාපෙති වටය මැද සිටින සිංහයා - රට හා විනයගරුක ජනයා
4. ධර්ම චක්‍රය - ධර්මය
5. ඉර හා හඳ - සදාතන පැවැත්ම

## රාජ්‍ය ලාංඡනය දැකගත හැකි අවස්ථා

1. රාජ්‍ය ආයතනවල
   - පාර්ලිමේන්තුවේ
   - රජයේ පාසල්වල
   - අමාත්‍යංශවල
   - රජයේ රෝහල්වල
   - දෙපාර්තමේන්තුවල
   - ගුවන් තොටුපොළෙහි



පාර්ලිමේන්තුව

2. රජයෙන් නිකුත් කරනු ලබන පොත්වල
   - පාසල් පෙළ පොත්වල
   - ගුරු මාර්ගෝපදේශවල
   - පාසල් නාම ලේඛනවල
3. රජයෙන් ඉදි කරනු ලබන ගොඩනැගිලිවල
   - බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ (BMICH)



## ශ්‍රී ලංකාව තුළ ඇති විවිධ සංස්කෘතිකාංග

1. දළදා පෙරහැර
2. මිහිඳු පෙරහැර
3. වෙල් පෙරහැර
4. කතරගම පෙරහැර
5. දෙවිනුවර පෙරහැර
6. මිලාද් උත්සවය (නබිතුමාගේ උපන්දින සැමරුම)
7. කතෝලික බැතිමතුන්ගේ දේවස්ථාන මංගල්‍යය
8. කැරොල් ගීත සන්දර්ශන

## දළදා පෙරහැර

- දැක ඇති ස්ථානය – මහනුවර
- පැවැත්වීමට හේතුව - දළදා වහන්සේ මූලික කර ගනිමින් පවත්වයි
- සංවිධානය කරනු ලබන්නේ - දළදා මාලිගාව හා සතර මහා දේවාල මගින්
- පවත්වන කාලය – සෑම වර්ෂයක ම ජූලි සහ අගෝස්තු මාසවල පවත්වයි
- පෙරහැරෙහි ඇති විශේෂාංග –

1. ආරක්ෂක රථය
2. කසකරුවන්
3. ගිනිබෝල කරුවන්
4. බෞද්ධ කොඩි
5. දිසා කොඩි
6. පිත්තල දිසා කොඩි
7. කඩු ගෙන යන්නෝ
8. පෙරමුණේ රාල
9. හේවිසිකරුවෝ
10. ගජනායක නිලමේ
11. හොරණෑ වාදකයෝ



12. චාමර නැටුම
13. ලීකෙලි
14. පන්තේරු
15. තාලම්
16. හවඩි දඟයා
17. නෛයංඩි
18. කඩු සරඹ
19. අත් රබන්
20. වේවැල් නැටුම
21. උඩැක්කි නැටුම
22. වෙස් කණ්ඩායම
23. කාරිය කොරවන කෝරාළ
24. නාගසිංගම්
25. උඩු වියන් සහිත පාවඩ මතින් කරඬුව වඩමවන මංගල හස්ති රාජයා සමඟ දැලේ ඇතුන් දෙදෙනා
26. බෞද්ධ කොඩි 02
27. කවිකාර මඩුව
28. මල් පහන් ගෙනියන්නෝ
29. දියවඩන නිලමෙතුමා
30. බුරුම කොඩි 02
31. ගම් දහයේ විදානේවරු
32. ඉන්පසු සිව්මහා දේවාලවල පෙරහැරවල්





- නැරඹූ ආකාරය -
- යොදා ගන්නා වාද්‍ය භාණ්ඩ -
  1. දවුල්
  2. තම්මැට්ටම්
  3. හොරණෑව





4. තාලම්පට
5. කොම්බුව
6. හක්ගෙඩි
7. අත් රබන්
8. පන්තේරු
9. ගැටබෙර
10. උඩැක්කිය





## වර්ෂයේ විශේෂ ආගමික උත්සව යෙදෙන දින

| උත්සවය | ආගම | දිනය |
|---|---|---|
| 1. තෛපොංගල් | හින්දු | ජනවාරි |
| 2. දුරුතු පුර පසලොස්වක පෝය | බෞද්ධ | ජනවාරි |
| 3. නවම් පුරපසලොස්වක පෝය | බෞද්ධ | පෙබරවාරි |
| 4. මහා ශිව රාත්‍රී දිනය | හින්දු | මාර්තු |
| 5. අළු බදාදා | ක්‍රිස්තියානි | මාර්තු |
| 6. මැදින් පුර පසලොස්වක පෝය | බෞද්ධ | මාර්තු |
| 7. බක් පුර පසලොස්වක පෝය | බෞද්ධ | අප්‍රේල් |
| 8. මහ සිකුරාදා | ක්‍රිස්තියානි | අප්‍රේල් |
| 9. පාස්කු ඉරිදා | ක්‍රිස්තියානි | අප්‍රේල් |
| 10. වෙසක් පුර පසලොස්වක පෝය | බෞද්ධ | මැයි |
| 11. රාමසාන් | ඉස්ලාම් | ජුනි |

| | | |
|---|---|---|
| 12. පොසොන් පුර පසළොස්වක පෝය | බෞද්ධ | ජූනි |
| 13. ඇසළ පුර පසළොස්වක පෝය | බෞද්ධ | ජූලි |
| 14. හජ්ජි | ඉස්ලාම් | අගෝස්තු |
| 15. නිකිනි පුර පසළොස්වක පෝය | බෞද්ධ | අගෝස්තු |
| 16. බිනර පුර පසළොස්වක පෝය | බෞද්ධ | සැප්තැම්බර් |
| 17. වප් පුර පසළොස්වක පෝය | බෞද්ධ | ඔක්තෝබර් |
| 18. දීපවාලි | හින්දු | ඔක්තෝබර් |
| 19. නබිතුමාගේ උපන්දිනය | ඉස්ලාම් | නොවැම්බර් |
| 20. ඉල් පුර පසළොස්වක පෝය | බෞද්ධ | නොවැම්බර් |
| 21. උඳුවප් පුර පසළොස්වක පෝය | බෞද්ධ | දෙසැම්බර් |
| 22. නත්තල් | ක්‍රිස්තියානි | දෙසැම්බර් |

## විවිධ ආගම්වල ආගමික උත්සව සඳහා යොදා ගන්නා සැරසිලි

1. බෞද්ධ ආගමිකයන්



- වෙසක් කූඩු
- බකට් කූඩු
- කොඩි එල්ලීම
- ගොක්කොළ සැරසිලි
- තොරණ්

2. හින්දු ආගමිකයන්



- කෝලම් රටා
- මල් සැරසිලි
- අලපනා / රංගෝලි සැරසිලි
- පහන් සැරසිලි



3. ඉස්ලාම් ආකමිකයන්

- මරතොණ්ඩි රටා

4. කතෝලික (ක්‍රිස්තියානි) ආගමිකයන්

- නත්තල් ගස
- ගවලෙන
- ඉටි පන්දම් සැරසිලි







**<u>සියලු ආගමිකයන් පොදුවේ කරනු ලබන ආගමික කටයුතු</u>**

1. සිරිපා වන්දනා කිරීම
2. සියලු ම බැතිමතුන් කතරගම වන්දනා කිරීම
3. සිල් සමාදන් වූ අයට දානය පිරි නැමීම
4. අවුරුදු කැවිලි පෙවිලි අන්‍යාගමිකයන් හා අන්‍ය ජාතිකයන් සමඟ බෙදා ගැනීම
5. රාමසාන් උත්සවය සඳහා සාදනු ලබන කෑම, ආහාර අන්‍යාගමිකයන් හා අන්‍ය ජාතිකයන් සමඟ බෙදා ගැනීම
6. නත්තල් ගස, ගවලෙන අන්‍යාගමිකයන් හා අන්‍ය ජාතිකයන්ගේ නිවෙස්වල ද සැකසීම

# ශ්‍රී ලංකාවේ ජීවත් වන ප්‍රධාන ජන වර්ග

- ප්‍රධාන ජන වර්ග 04 කි.

    1. සිංහල
    2. දෙමළ
    3. මුස්ලිම්
    4. බර්ගර්

## සිංහල



- මුළු ජන ගහනයෙන් 74% කි
- ඇඳුම් පැළඳුම් -

  පිරිමි - ආර්ය සිංහල ඇඳුම

  ගැහැනු - ඔසරිය සහ අත්බෝරිච්චි හැට්ටය
- කතා කරන භාෂාව - සිංහල
- ආහාර පාන -

  දොදොල්

  කොකිස්

  කැවුම්





වැලි තලප

කිරිබත්

කොස් ඇට කළුපොල්

බත්

කොළ කැඳ





- අදහන ආගම - බෞද්ධ
- ආගමික ශාස්තෘවරයා - බුදුරජාණන් වහන්සේ




- ආගමික සිද්ධස්ථානය - පන්සල



- ආගමික සංකේතය - ධර්ම චක්‍රය



- ආගම ගැන ලියවුණු ග්‍රන්ථය - ත්‍රිපිටකය




- ආගමික අනුගාමිකයා - භික්ෂූන් වහන්සේ



- ආචාර කරන ආකාරය - දෑත් එක් කොට ආයුබෝවන් කියා



- ආගමික උත්සව -

  වෙසක් උත්සවය

  පොසොන් උත්සවය

  ඇසළ උත්සවය

  මිහිඳු පෙරහැර

  දළදා පෙරහැර

## <u>දෙමළ</u>



- මුළු ජන ගහනයෙන් 12.6% ක් ලංකා දෙමළ 5.5% ක් ඉන්දියානු දෙමළ
- ඇඳුම් පැළඳුම් -

  පිරිමි - වෙට්ටිය හා බැනියම

  ගැහැනු - සාරිය සහ ඉන්දියානු හැට්ටය




- කතා කරන භාෂාව - දෙමළ
- ආහාර පාන -



  තෝසේ

  වඩේ

  ඉට්ලි

  මුරුක්කු





- අදහන ආගම - හින්දු
- ආගමික ශාස්තෘවරයා - ශිව දෙවියන්



- ආගමික සිද්ධස්ථානය - කෝවිල




- ආගමික සංකේතය - ඕම් ලකුණ





- ආගම ගැන ලියවුණු ග්‍රන්ථය - භගවත් ගීතාව




- ආගමික අනුගාමිකයා - හින්දු පූජකතුමා



- ආචාර කරන ආකාරය - දෑත් එක් කොට වණක්කම් කියා



- ආගමික උත්සව -
  තෛපොංගල්
  දීපාවලී
  මහා ශිව රාත්‍රී

# මුස්ලිම්




- මුළු ජන ගහනයෙන් 7.1% කි.
- ඇඳුම් පැළඳුම් -

  පිරිමි - ජුම්බාය හා තොප්පිය

  ගැහැනු - හබායා, හිසට ඉජාපාජ නමින් රෙදි කඩක් යොදයි.
- කතා කරන භාෂාව - දෙමළ
- ආහාර පාන -

  බුරියානි

  පරාටා

  වටලප්පන්

  සරුවත්

  රටඉදි

  බූන්දි














- ආගමික සිද්ධස්ථානය - මස්ජිදය



- අදහන ආගම - ඉස්ලාම්
- ආගමික ශාස්තෘවරයා - අල්ලාහ් දෙවියන්
- ආගමික සංකේතය - අඩ සඳ හා තරුව



- ආගම ගැන ලියවුණු ග්‍රන්ථය - අල් කුරානය



- ආගමික අනුගාමිකයා - මව්ලවිතුමා



- ආචාර කරන ආකාරය -

  අස්ලාම් අලෛක්කුම්!

  වාලෛක්කුම් සලාම්!




- ආගමික උත්සව -

  රාමසාන්

  මිලාද් උත්සවය (නබිනායකතුමාගේ උපන්දිනය)

  හජ්ජි

## <u>බර්ගර්</u>



- මුළු ජන ගහනයෙන් 0.3% කි.
- ඇඳුම් පැළඳුම් -

  පිරිමි - කලිසම, කමීසය, කබාය, කරපටිය සහිත යුරෝපීය ඇඳුම

  ගැහැනු - ගවුම
- කතා කරන භාෂාව - ඉංග්‍රීසි



- ආහාර පාන -



  රයිස්

  කේක්


  පුඩිං

  අයිස්ක්‍රීම්

  සැන්විච්

  ජෙලි

  බීම









- අදහන ආගම - ක්‍රිස්තියානි / කතෝලික
- ආගමික ශාස්තෘවරයා - ජේසුස් වහන්සේ



- ආගමික සිද්ධස්ථානය - පල්ලිය



- ආගමික සංකේතය - කුරුසය



- ආගමික අනුගාමිකයා - පියතුමා



- ආගමික උත්සව -


  නත්තල

  පාස්කු මංගල්‍ය

  මහ සිකුරාදා

  වාර්ෂික මංගල්‍ය

- ආගම ගැන ලියවුණු ග්‍රන්ථය - බයිබලය




- ආචාර කරන ආකාරය - අතට අත දී



❖ සියලු ජන වර්ග එකතු වී එකමුතුව ශ්‍රී ලාංකිකයන් ලෙස කටයුතු කළ යුතුය.

## ජන වර්ග සමගියෙන් ජීවත් වීම ගැන කියවෙන ගීත

ලොවේ සැමා එකම දැයේ දූ දරුවන් වේවා!
වාද නැතී, බේද නැතී
ලස්සන ලොව හෙට අපට උදා වේවා!

මනුස්සකම් අහක දමා
ජාතිවාදයෙන් උදම් අනා
සතුරු කමින් පිල් බෙදිලා
මිනිසා මුලා වෙලා

ලොවේ සැමා එකම දැයේ දූ දරුවන් වේවා!
වාද නැතී, බේද නැතී
ලස්සන ලොව හෙට අපට උදා වේවා!

වැටුණු කෙනෙකු හට නැගී සිටින්නට
අත දෙන්නට පැකිලෙන්න එපා
ඔහුගේ රට, ජාතිය, ආගම
කුල, ගොත ගැන හොයන්නෙපා

සාමයේ ගීතිකා පතුරාලා මුළු ලෝ තලේ
එක යායේ වාස වෙමු සැමදා එකට බැඳී

ලොවේ සැමා එකම දැයේ දූ දරුවන් වේවා!
වාද නැතී, බේද නැතී
ලස්සන ලොව හෙට අපට උදා වේවා!

ලොවේ සැමා එකම දැයේ දූ දරුවන්

ගායනය : සුනිල් පෙරේරා

## අපේ රටට ආදරය දැක්විය හැකි ආකාර

1. රට තුළ ඇති ස්වාභාවික සම්පත් ආරක්ෂා කර ගැනීම.
2. සියලු ජාතීන් සමගියෙන් ජීවත් වීම.
3. සියලු ම ජාතීන්ට සමාන අයිතිවාසිකම් ලබා දීම.
4. රට තුළ ඇති සංස්කෘතිකාංග ආරක්ෂා කර ගැනීම
5. රටට ආදරය කරන පුරවැසියෙකු වීම

## රටට සේවය කළ හැකි ආකාර

1. රට ආරක්ෂා කර ගැනීමට ත්‍රිවිධ හමුදාවට බැඳීම
2. රටට සේවාවන් ඉටු කරන රැකියාවල නිරත වීම
    - හෙද සේවය
    - ගුරු සේවය
3. තමාට හැකි අයුරින් අසරණ අයට පිහිට වීම
4. තමාට හැකි අයුරින් ස්වභාවදහම රැක ගැනීම
    - ගස් සිටුවීම
    - පොලිතින් වැනි කැලිකසළ පරිසරයට මුදා නොහැරීම
    - සතුන්ට ආදරය කරුණාව දැක්වීම

## මාතෘභූමියට ගෞරවය දැක්විය හැකි ආකාර

1. මාතෘභූමිය ආරක්ෂා කර ගැනීම.
2. ජාතික ගීයට ගරු කිරීම.
3. ජාතික කොඩියට ගරු කිරීම.
4. අවංක, අනතිමානී, විශ්වාසවන්ත පුරවැසියෙකු ලෙෂ කටයුතු කිරීම.

## තමාටත්, තම පවුලටත්, පාසලටත්, රටටත් ආඩම්බර විය හැකි ආකාර

1. යහපත් පුරවැසියෙකු ලෙස ජීවත් වීම.
2. සැමවිටම තමාටත්, තමාගෙන් අනුන්ටත් හිරිහැරයක්, බාධාවක්, පීඩාවක් නොවන අයුරින් කටයුතු කිරීම.

## 1815 දී ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍යයන්ට යටත් වූ පසු රට නිදහස් කර ගැනීමට උදාර සේවාවක් කළ පුද්ගලයෝ

- මොවුන් විශාල කැපවීම් කළ නිර්භීත පුද්ගලයෝ විය.
- එඩිතර නායකයින් විය.

• ජාති, ආගම් භේදයකින් තොරව ක්‍රියා කළහ.



වීදිය බණ්ඩාර



මායාදුන්නේ




කිවුලේගෙදර මොහොට්ටාල




කැප්පෙටිපොල අදිකාරම




සීතාවක රාජසිංහ



ගොන්ගාලේගොඩ බණ්ඩා



වීර පුරන්අප්පු



අනගාරික ධර්මපාල තුමා



හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි



සිද්දි ලෙබ්බෙ



පොන්නම්බලම් අරුනාචලම්



ඊ. ඩබ්ලිව්. පෙරේරා



ඩී. එස්. සේනානායක



සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර



ඩී. බී. ජයතිලක




හෙන්රි ස්ටිල් ඕල්කට්



ටී. බී. ජයා



පොන්නම්බලම් රාමනාදන්



එස්. මහින්ද හිමි





මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි

## අප ප්‍රදේශය තුළ සිටින රටට කීර්තියක් ලබා දුන් පුද්ගලයෝ

1. කුමාරතුංග මුනිදාස - සිංහල භාෂාව හා සාහිත්‍ය පිළිබඳ ව පොත් රාශියක් ලියා තිබීම
2. කවට අන්දරේ - රජමාලිගේ සිටි විකටයා
3. මංජුල කුමාර - උස පැනීමේ අංශයේ ඔලිම්පික් තරඟයට සහභාගී විය

## අප ප්‍රදේශය තුළ ඇති රාජ්‍ය හා පෞද්ගලික ආයතන

| රාජ්‍ය ආයතන | පෞද්ගලික ආයතන |
|---|---|
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | නිවාඩු නිකේතන |
| රාජ්‍ය බැංකු<br>• ලංකා බැංකුව<br>• මහජන බැංකුව<br>• ඉතිරි කිරීමේ බැංකුව | පෞද්ගලික බැංකු<br>• සම්පත් බැංකුව<br>• කොමර්ෂල් බැංකුව |
| පොලීසිය | පෞද්ගලික පන්ති |

| | |
|---|---|
| රජයේ රෝහල<br>• බතීගම රෝහල | සුපිරි වෙළඳසැල්<br>• foodcity<br>• දම්රෝ |
| දික්වැල්ල ප්‍රාදේශීය සභාව | පෞද්ගලික බෙහෙත් ශාලා<br>• Medicare |
| තැපැල් කාර්යාලය | |
| මහජන සෞඛ්‍යය පරීක්ෂක කාර්යාලය | |
| මහජන පුස්තකාලය | |
| ජල සම්පාදන මණ්ඩලය | |
| විදුලිබල මණ්ඩලය | |
| කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය | |
| රජයේ පාසල් | |

## <u>උකුසු හාමි ක්‍රීඩාව</u>

- සිසුන් අත් අල්ලාගෙන රවුමක් සාදා ගන්න.
- ඉන් පසු අත් අත්හැර එක් දිශාවකට රවුමේ වටේ ඇවිදගෙන ගමන් කරන්න.
- එක් සිසුවකු එම රවුම මැද කුඩා රවුමක් සකස් කර ගන්න.
- මැද සිටින සිසුවා උකුස්සා ලෙස නම් කරන්න. ඉන් පසු උකුස්සා මෙන් පියාසර කරවන්න.
- එවිට වටේ සිටින සිසුන්ට පහත පරිදි ප්‍රකාශ කිරීමට උපදෙස් දෙන්න.

  උකුසු හාමි බොහොම ඉහළ - මුව පැටියෙක් ඇල්ලුවා
  උකුසු හාමි බොහොම ඉහළ - මී පැටියෙක් ඇල්ලුවා
  උකුසු හාමි බොහොම ඉහළ - හා පැටියෙක් ඇල්ලුවා
  ඒත් ඔයාට මාව අල්ලන්න තාම බැනේ . . .
- එසේ කියූ විගස ඇවිදින සිසුන් පසුපස ලුහුබැඳ ගොස් එයින් කෙනෙකු අල්ලා ගනියි.
- ඉන් පසු නැවත ක්‍රීඩාව ආරම්භ වෙයි.
- අවශ්‍ය වන්නේ නම් දෙපස සීමාව සඳහා රේඛා 02ක් ලකුණු කොට, එම රේඛා දෙක වෙත දිවයෑමට පෙර අයකු අල්ලා ගැනීමට සලස්වන්න.
- එසේ ඇල්ලීමට නොහැකි වුවහොත් නැවත උකුස්සා වන්නේ ඔහු හෝ ඇය හෝ ය. යමකු හසුවුවහොත් ඔහු හෝ ඇය හෝ උකුස්සා වේ.

<u>**ජාතියක් ලෙස අපේ අභිමානය දනවන කවි, ගී**</u>

1. පෙරදිග මුතු ඇටයයි මේ - ලෝකේ සිරිබර සිරිලංකා
   ලතා වල්පොල / ධර්මදාස වල්පොල
2. රත්න දීප ජන්ම භූමි - ලංකා දීප විජය භූමි
   පණ්ඩිත් ඩබ්ලිව්. ඩී. අමරදේව
3. ලංකා ලංකා පෙම්බර ලංකා - පිනවමු ඔබ ලංකා
   සුනිල් සාන්ත
4. මේ සිංහල අපගෙ රටයි - අප ඉපදෙන මැරෙන රටයි
   නන්දා මාලනී
5. හෙළ ජාතික අභිමානේ
   සී. ටී. ප්‍රනාන්දු
6. 'මගේ රට' කවි පන්තිය
   පී. බී. අල්විස් පෙරේරා

සිත්තම් ගෙදර